පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 79

ආයතනයේ නම: කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 79

நிறுவனத்தின் பெயர்: கைத்தொழில் அமைச்சகத்தின் கீழ் உள்ள நிறுவனங்கள்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் நிறுவன கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 79

Name of the Institution: Institutions under purview of the Ministry of Industry

Submission of observations of Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee On Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : **79**

ආයතනයේ නම : **ජේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව**

පාර්ලිමේන්තුවේ රජයේ ඉණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்:290

நிறுவனத்தின் பெயர்: புடவை கைத்தொழில் திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 79

Name Of The Institution : Department of Textile Industry

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4).

	පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය : 79	
	ආයතනයේ නම : පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව	
	වර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගන්නා ලද අඩු පාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්ත්වය
	<u>පළමු කොටස</u>	
	අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි	අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී.
	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත	අවදානම් ලේඛනය යාවත්කාලීන කර ඇත.
	මු.රෙ.134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩ සටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුනි	අභ්‍යන්තර විගණන වැඩසටහන ආරම්භ කිරීමට කටයුතු කරන ලදී.
	සමාලෝචිත වර්ෂවල විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි	කර්මාන්ත අමාත්‍යාංශය මගින් පවත්වනු ලැබූ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගී වී ඇත.
	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවතෙන හිඟ ණය ශේෂය පැවතුනි	අදාල නිලධාරීන් විශ්‍රාම ගැන්වීමට අදාල ලේඛන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් එම ගැටළු නිරවුල් කල පසු ණය ශේෂ නිරවුල් කර නිවැරදි කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
	දෙවන කොටස	
	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුනි	කාර්ය සාධන ගිවිසුම් සකස් කර ඇත
	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 අනුව වියදම් කළමණාකරණය සඳහා අත්‍යාවශ්‍ය පුහුණු අවස්ථා පමණක් ලබාදීම .
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂයේ විගණන නිරීක්ෂණ මගින් පෙන්වා දෙන ලද අඩුපාඩු ඉදිරියේ දී සිදුවීම් වැළැක්වීම් සඳහා ආයතනයේ සියළුම නිලධාරීන් දැනුවත් කර ඇත.

වෛද්‍ය රමේෂ් පතිරණ (පා.ම)
කර්මාන්ත අමාත්‍ය

වෛද්‍ය රමේෂ් පතිරණ (පා.ම.)
කර්මාන්ත අමාත්‍ය
කර්මාන්ත අමාත්‍යාංශය
73/1, ගාලු පාර, කොළඹ 03.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 79

ආයතනයේ නම - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ඉණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 79

நிறுவனத்தின் பெயர் - கம்பெனிகள் பதிவாளர் திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குகள் பற்றிய தெரிவுக் குழுவால் சமர்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பாக நிலையியற் கட்டளை இல 119 (4) இன் கீழ், நிறுவனங்களுக்குப் பொறுப்பான கௌரவ அமைச்சர் அவர்களது அவதானிப்புக்களையும் எடுக்கப்பட்ட நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்குச் சமர்பிக்கிரேன்.

Parliamentary Series No. - 79

Name of Institution - Department of Registrar of Companies

Submission of observations of the Hon. Minister in charge of the Institutions and step taken with regard to the reports tabled by the committee on Public Accounts in terms of Standing Order No.119 (4)

ආකෘති පත්‍රය (අංක 01)
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 79
ආයතනයේ නම :- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

පළමු කොටස : 94.00

	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්වය
1	විගණකාධිපති විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබීම	විගණකාධිපති විසින් යොමු කරන ලද විගණන විමසුම් සඳහා විමසුමට අදාල එක් එක් අංශයන්ගෙන් පිළිතුරු ලබා දීම ප්‍රමාද වීම නිසා නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කිරීමට නොහැකි විය. ඉදිරියේදී මෙම ප්‍රමාදය මහහරවා මසක් තුල පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව දන්වමි.
2	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම	• රා. මු.වක්‍රලේඛ 01/2024 ට අනුව පහත නිලධාරීන් තිදෙනාගේ ණය ශේෂයන් කපා හැරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිතය. <u>ස්ථාන මාරු ගිය</u> 1. ටී .එම්.වී. පීරිස් මයා- නීතිපති දෙපාර්තමේන්තුව(1989.01.17) - රු. 10,935.00 2. එම්.ජී. මද්දුම බණ්ඩාර මෙය - වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලය (2000.09.02)- රු. 32,540.00 <u>තනතුර අතහැර ගිය</u> 3. කේ.ඒ. ප්‍රනාන්දු මයාගෙන් අයවිය යුතු රු. 17,000 ක ණය ශේෂය • <u>විශ්‍රාම ගිය</u> ඔබි.ඒ. ඩී. එස්. විජේතුංග මිය - රු. 202,200.00 මෙම ණය ශේෂය, වාරිකය රු. 2,550 ක් සහ අදාල පොළිය සමඟ ඇපකරුගෙන් අයකර ගනිමින් පවතී. • <u>ස්ථාන මාරු ගිය</u> කේ.කේ.ඩී.ආර්.ඒ. හේමවන්ද්‍ර මයා - සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය (1998.07.01)- රු. 77,266.00 රජය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PFD/RED/08/2015/01 හා 2016.03.18 දිනැති ලිපිය අනුව දන්වා ඇත්තේ අත්තිකාරම් බී ගිණුමින් ලබාගත් ණය ශේෂය නිරවුල් කර ඇති බැවින් එකී ණය මුදල කපා හැරීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කිරීම පමණක් ප්‍රමාණවත් බවත් දන්වා ඇත. ඒ අනව ඉදිරි කටයුතු මෙම වසර තුල සිදු කරමි.

ආකෘති පත්‍රය (අංක 01)
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 79
ආයතනයේ නම :- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

දෙවන කොටස :72.00


	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්වය
1	රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම.	2023/2024 මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇත.(ඇමුණුම I)
2	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබීම.	රාජ්‍ය අංශය තුල මානව සම්පත් සංවර්ධනය කිරීම මැයෙන් වූ 2023.11.30 දිනැති* රා.පරි. චක්‍රලේඛ 02/2018(1) අනුව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම අවශ්‍ය නොවේ. (ඇමුණුම II)
3	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබීම.	සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ආර්.ආර්. එස්.සී. රත්නායක මයා ධාරිතා හා නිපුණතා සංවර්ධන නිලධාරී ලෙස නම් කර ඇත. (ඇමුණුම III)
4	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම සම්බන්ධව 2024.01.10 දිනැති නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 අනුව කාර්යමණ්ඩලය සඳහා අත්‍යාවශ්‍ය පුහුණු පාඨමාලා පමණක් ලබා දෙන ලෙස දන්වා ඇති බැවින් එවැනි පුහුණු පාඨමාලා සඳහා පමණක් නිලධාරීන් සහභාගී කරවන ලදි.

ගරු. වෛද්‍ය රමේෂ් පතිරණ (පා.ම.)

කර්මාන්ත අමාත්‍ය 2024/08/13

මානව සම්පත් සංවර්ධන සැලැස්ම

2023/2024



කර්මාන්ත අමාත්‍යාංශය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2023/2024 වර්ෂ සඳහා වන මානව සම්පත් සංවර්ධන සැලැස්ම

1. සංවිධානය

1.1 අමාත්‍යාංශය - කර්මාන්ත අමාත්‍යාංශය
දෙපාර්තමේන්තුව - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

2. සංවිධානය සැකැස්ම

2.1 දැක්ම - ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අංශ ආවරණය කරමින් සංස්ථා යහපාලනය පිළිබඳව හැකියාවක් ක්‍රම ක්‍රමයෙන් බිහි කිරීමට සමත් සක්‍රීය නියාමන අධිකාරියක් ඇති කිරීම තුළින් විශ්වාසනීය ව්‍යාපාරික පසුබිමක් සංවර්ධනය කිරීම හා පෝෂණය කිරීම.

2.2 මෙහෙවර - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව රජයේ ආර්ථික ප්‍රතිපත්තියට හා වෙළඳ ප්‍රතිපත්තියට අනුකූලතාවයක් ඇති වන සේ අදාළ පනත් යටතේ ව්‍යාපාර හා අනෙකුත් ආයතන සඳහා නීතිමය තත්ත්වයක් ලබා දීමට හා ඒවායේ කාර්යයන් ක්‍රමවත් කිරීමට පරිශ්‍රමයක් දරයි.

2.3 අගයන්

2.3.1 ගුණාත්මකභාවය
2.3.2 වගවීම
2.3.3 සාධාරණත්වය
2.3.4 සේවක සංවර්ධනය
2.3.5 කණ්ඩායම් හැඟීම

2.4 ඉලක්ක

2.4.1 ආයතනයෙහි සෑම නිලධාරියෙකු සඳහාම පුහුණු අවස්ථාවක් ලබාදීම.

2.4.2 සමාගමක් සංස්ථාපනය කිරීමේ සිට සමාගමක් වසා දැමීම දක්වා සියළුම කාර්යයන් 100% ක් මාර්ගත ක්‍රමය මඟින් සිදුකරනු ලබන e-ROC පද්ධතිය සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් සඳහා පුහුණු අවස්ථාවන් ලබාදීම.

2.4.3 දෙපාර්තමේන්තුව තුල සියළුම නිලධාරීන්ගේ විෂය දැනුම යාවත්කාලීන කරගැනීම හා දැනුම වර්ධනය කර ගැනීම සඳහා තෝරාගන්නා ලද විෂයයන් සඳහා පුහුණුවක් ලබාදීම.

2.4.4 ආකල්ප හා සහයෝගීතාව වර්ධනය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

2.5 අරමුණු

2.5.1 දෙපාර්තමේන්තුවේ සියඵම නිලධාරින් තම රාජකාරී වපසරියට අදාලව දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම.

2.5.2 දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩලය අතර අන්‍යෝන්‍ය සුහදතාව සහ සාමූහිකත්වය ගුණාංග වර්ධනය කිරීම.

2.5.3 සේවක අභිප්‍රේරණය තුලින් ආයතනික සහ පුද්ගලික ඵලදායිතාව ඉහල නැංවීම මඟින් සමස්ථ ඵලදායිතාවය ඉහල නැංවීම

2.5.4 මෙම දෙපාර්තමේන්තුව පිළිබඳව සේවාලාභීන් තුල යහපත් ප්‍රතිරූපයක් ගොඩනැංවීම.

3. ආයතනයේ මානව සම්පත්

3.1 පවත්නා මානව සම්පත් ගැටළු (පවත්නා තත්ත්වය)	3.2 අපේක්ෂිත මානව සම්පත් අභියෝග (අනාගතවාදී දැක්මකින් යුතුව)	3.3 අපේක්ෂිත මානව සම්පත් නිපුණතාවන් (අපේක්ෂිත තත්ත්වය)
කළමනාකරණ සේවා නිලධාරීන්ගේ හා සංවර්ධන නිලධාරීන්ගේ හිඟතාවය	• පාඨමාලාවන් සඳහා නිලධාරීන් යොමු කිරීම • වියදම් කළමනාකරණය හේතුවෙන් පැවැත්විය හැකි පාඨමාලා ප්‍රමාණය අඩුවීම.	නිලධාරීන්ගේ විෂය දැනුම පුළුල් කිරීම.
සමාගම් පරීක්ෂකවරුන්ගේ හිඟතාවය	• MN 4 මට්ටමේ වැටුප් තලයට වඩා වැඩි වැටුප්තල වෙත යොමුවීම.	සුදුසුකම් ලත් නිලධාරීන් දෙපාර්තමේන්තු තනතුරු වෙත බඳවා ගැනීම
ඉංග්‍රීසි භාෂා දැනුම ප්‍රමාණවත් නොවීම	• පාඨමාලාව පැවැත්වීමට කාලය කළමනාකරණය කර ගැනීම. • නිලධාරීන් ඒ සඳහා යොමු කිරීම.	සියඵම නිලධාරීන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම පුළුල් කිරීම.

4. මානව සම්පත් කළමනාකරණ සැලැස්ම

4.1 පුහුණු උපායමාර්ග

අපේක්ෂිත නිපුණතා මට්ටම	පවතින නිපුණතා මට්ටම	අවශ්‍ය පුහුණුව	සැලසුම් කල පුහුණු වැඩසටහන්
i. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ e-ROC පද්ධතිය පිළිබඳ යාවත්කාලීනව වූ මනා දැනුමකින් සමන්විත වීම.	අධීක්ෂණයක් යටතේ රාජකාරීන් කිරීමට ප්‍රමාණවත් විෂය දැනුමක් ලබා තිබීම.	විෂය දැනුම පුළුල් කිරීමට හා යාවත්කාලීන කිරීමට පුහුණු වැඩසටහන්	කාර්තුවකට එක බැගින් පුහුණු වැඩසටහන් පැවැත්වීම.

ii. රාජ්‍ය සේවකයෙක් ලෙස රාජ්‍ය සේවය හා රාජකාරි පිළිබඳ පොදු දැනුමකින් යුක්තවීම.	සියළු නිලධාරීන් පුහුණුවීම් තුලින් සාමාන්‍ය දැනුමක් ලබා තිබීම.	රාජ්‍ය සේවකයින්ට පොදුවේ අදාල වන කාර්ය පටිපාටි. මාර්ගෝපදේශ. නීති රෙගුලාසි, අණ පනත් යනාදිය පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීමේ පුහුණු වැඩසටහන්	නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන එම පුහුණුවීම ලබාදෙන ආයතන හරහා අවශ්‍ය පුහුණුව ලබාදීම.
iii. රාජකාරී කටයුතු කාර්යක්ෂමව කිරීම සඳහා ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කර ගැනීම	රාජකාරී කළමනාකරණය කරගත හැකි මට්ටමේ පවතී	ඉංග්‍රීසි භාෂා දැනුම පුළුල්කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන්	පුහුණුවීම් ලබා දෙන ආයතන හරහා අවශ්‍ය පුහුණුව ලබාදීම.
iv. රාජකාරී කාර්යක්ෂමව ඉටු කිරීමට ප්‍රමාණවත් පරිගණක දැනුමකින් සමන්විත වීම.	රාජකාරී කළමනාකරණය කරගත හැකි මට්ටමේ පරිගණක දැනුමක් පවතී.	Excel, Word, Power Point හා දත්ත සැකසුම් පිළිබඳ අවශ්‍ය උසස් පුහුණුවීම් ලබාදීම.	නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන එම පුහුණුවීම ලබාදෙන ආයතන හරහා අවශ්‍ය පුහුණුව ලබාදීම.
v. රාජකාරී කටයුතු සඳහා කුසලතා හා ආකල්ප වර්ධනය කර ගැනීම තුලින් යහපත් සේවාවක් සැපයීම	කුසලතා හා ආකල්ප තවදුරටත් වර්ධනය විය යුතුය.	කුසලතා හා ආකල්ප වර්ධනය කරගැනීමේ වැඩසටහන් පැවැත්වීම.	කුසලතා හා ආකල්ප වර්ධනය කර ගැනීමට අදාළව පුහුණුවීම් ලබා දෙන ආයතන හරහා අවශ්‍ය පුහුණුව ලබාදීම.

4.2 මානව සම්පත් කළමනාකරණ වැඩසටහන් ප්‍රමුඛතාකරණය

සැලසුම් කල පුහුණු වැඩසටහන්		අත්‍යාවශ්‍ය	අවශ්‍ය	අවශ්‍යම නොවන
i.	රාජ්‍ය සේවකයින්ට පොදුවේ අදාලවන කාර්යාල ක්‍රම, මාර්ගෝපදේශ, නීති රෙගුලාසි, අන පනත් යනාදිය පිළිබඳ දැනුම ලබාදීමේ වැඩසටහන්	✓		
ii.	නිලධාරීන්ගේ විෂය සමගාමී දැනුම පුළුල් කිරීමේ පුහුණු වැඩසටහන්	✓		
iii.	ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහනක් සියළුම නිලධාරීන් සඳහා පැවැත්වීම		✓	
iv.	පරිගණක පුහුණු වැඩසටහන්		✓	
v.	කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන්		✓	
vi.	සේවක අභිප්‍රේරණය ඉහල නැංවීම මගින් ආයතනික ඵලදායිතා වර්ධනය කර ගැනීම		✓	

5. වසරේ අවසන් ප්‍රතිඵල සැලැස්ම

5.1 මූලික සැලැස්ම

තෝරා ගත් ප්‍රතිඵල වැඩසටහන්	ඉලක්කගත කණ්ඩායම	ප්‍රතිඵල වැඩසටහනේ ප්‍රධාන අරමුණ	කාල පරාසය	අපේක්ෂිත නිපුණතා මට්ටම වෙත ළඟා වීම සඳහා වන යාන්ත්‍රණය
i. රාජ්‍ය සේවකයින්ට පොදුවේ අදාල වන කාර්ය පටිපාටි, මාර්ගෝපදේශ, නීති රෙගුලාසි, අණ පනත් යනාදිය පිළිබඳ දැනුම ලබා දීමේ ප්‍රතිඵල වැඩසටහන්	ආයතනයේ සියළු නිලධාරීන්	රාජ්‍ය සේවකයෙක් ලෙස රාජ්‍ය සේවය හා බැඳි රාජකාරී පිළිබඳ අවශ්‍ය අවම දැනුමින් සන්නද්ධ කිරීම.	සෑම නිලධාරියෙක් සඳහාම අවම වශයෙන් වසරකට පැය 08 කට නොඅඩු ප්‍රතිඵලයක් ලබාදීම.	දේශන, බහු මාධ්‍ය ඉදිරිපත් කිරීම්, කණ්ඩායම් අභ්‍යාස හා ඇඟයීම්
ii. e-ROC පද්ධතිය පිළිබඳ දැනුම ප්‍රළුල් කිරීම සඳහා ප්‍රතිඵල වැඩසටහන්	e-ROC පද්ධතිය සමඟ කටයුතු කරන නිලධාරීන් ප්‍රමුඛව අනෙකුත් නිලධාරීන්	විෂය සමගාමී දැනුම ප්‍රළුල් කිරීම හා යාවත්කාලීන කිරීම.	එක් කාර්තුවකට පැය 04 කට නොඅඩු ප්‍රතිඵලයක්	දේශන, බහු මාධ්‍ය ඉදිරිපත් කිරීම
iii. කුසලතා හා ආකල්ප වර්ධන ප්‍රතිඵලය	ආයතනයේ සියළු නිලධාරීන්	සේවාදායකයින් වෙත ගුණාත්මක සේවාවක් සැපයීම	2024 වසර තුල	දේශන, බහු මාධ්‍ය ඉදිරිපත් කිරීම්
iv. ඉංග්‍රීසි භාෂා ප්‍රතිඵල වැඩසටහන	ආයතනයේ සියළු නිලධාරීන්	සියළු නිලධාරීන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම ප්‍රළුල් කිරීම	2024 වසර තුල	දේශන, බහු මාධ්‍ය ඉදිරිපත් කිරීම්, ස්වයං අධ්‍යනය, භූමිකා රංගන, කණ්ඩායම් අභ්‍යාස හා ඇඟයීම්
v. පරිගණක ප්‍රතිඵල	නිලධාරීන්ගේ රාජකාරී අවශ්‍යතාව මත පරිගණක ප්‍රතිඵල අවශ්‍ය නිලධාරීන් සඳහා	රාජකාරී කාර්යක්ෂමව ඉටු කිරීමට ප්‍රමාණවත් උපස් පරිගණක දැනුමක් නිලධාරීන්ට ලබාදීම.	2024 වසර තුල	දේශන, බහු මාධ්‍ය ඉදිරිපත් කිරීම්, ස්වයං අධ්‍යනය, කණ්ඩායම් අභ්‍යාස හා ඇඟයීම්
vi. ඵලදායිතා වර්ධනය	ආයතනයේ සියළු නිලධාරීන්	සේවක අභිප්‍රේරණය ඉහල නැංවීම	2024 වසර තුල	දේශන, කණ්ඩායම් අභ්‍යාස හා ඇඟයීම්

5.2 කාල රාමුව

තෝරාගත් පුහුණු වැඩසටහන්	1	2	3	4	5	6	7	8	9	10	11	12
i. රාජ්‍ය සේවකයින්ට පොදුවේ අදාල වන කාර්ය පටිපාටි, මාර්ගෝපදේශ, නීති රෙගුලාසි, අණ පනත් යනාදිය පිළිබඳ දැනුම ලබා දීමේ පුහුණු වැඩසටහන්												
ii. e-ROC පද්ධතිය පිළිබඳ දැනුම පුළුල් කිරීම සඳහා පුහුණු වැඩසටහන්												
iii. කුසලතා හා ආකල්ප වර්ධන පුහුණුව												
iv. ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන												
v. පරිගණක පුහුණුව												
vi. ඵලදායිතා වර්ධනය												

5.3 විෂයමාලා සැලැස්ම

තෝරාගත් පුහුණු වැඩසටහන්	ප්‍රධාන විෂය ක්ෂේත්‍ර
i. රජ්‍ය සේවකයින් අවශ්‍ය වන විෂය සමගාමී වැඩසටහන්	ආයතන සංග්‍රහය, මූදල් රෙගුලාසි, කාර්යාල ක්‍රම, කාර්ය පටිපාටි, මාර්ගෝපදේශ, නීති රෙගුලාසි, අණ පනත් යනාදී විෂයන්
ii. e-ROC පද්ධතිය පිළිබඳ දැනුම පුළුල් කිරීම සඳහා පුහුණු වැඩසටහන්	සියළුම පෝරම් සඳහා eROC Back end පුහුණුව, eROC Front end පුහුණුව, මුරපද කළමනාකරණය (Password Management), Login Operations, පද්ධති ආරක්ෂණය (System Security)
iii. කුසලතා හා ආකල්ප වර්ධන පුහුණුව	ධනාත්මක චිත්තය, කාල කලමනාකරණය, ආකල්ප වර්ධන වැඩසටහන්
iv. ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන	ලිවීම, ව්‍යාකරණ,කථනය, සවන්දීම ආදී ඉංග්‍රීසි භාෂා පුහුණුවට අදාළ විෂයයන්
v. පරිගණක පුහුණුව	Excel, Word, Power Point හා දත්ත සැකසුම් ආදී විෂයයන්
vi. ඵලදායිතා වර්ධන පුහුණුව	සේවක අභිප්‍රේරණය හා සම්බන්ධ විෂයයන්

6. කර්යසාධන කළමනාකරණය

6.1 කාර්ය සාධන ඇගයීම්

සේවා ගණය	කාර්යසාධන ඇගයීම් ආකෘතියේ ඇමුණුම් අංකය	කාර්යසාධන ගිවිසුම් ආකෘතියේ ඇමුණුම් අංකය
1. ජ්‍යෙෂ්ඨ මට්ටම - මාණ්ඩලික	1	01
2. තෘතීය මට්ටම -	1	01
3. ද්විතීක මට්ටම - මාණ්ඩලික නොවන	2(I)/2(II)	01
4. ප්‍රාථමික මට්ටම - මාණ්ඩලික නොවන	3	01

6.2 පුහුණුවේ ප්‍රතිඵලය ඇගයීම සඳහා වන යාන්ත්‍රණය

සේවා ගණය	පුහුණුව මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ධනාත්මක/පැහැදිලි නැත/ වෙනසක් නැත	ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරන්නන් අගය කිරීමේ යාන්ත්‍රණය	අඩු කාර්යසාධනයක් පෙන්නුම් කරන්නන් සඳහා වන යාන්ත්‍රණය
1.ජ්‍යෙෂ්ඨ මට්ටම	ධනාත්මක	ප්‍රසංශාත්මක ලිපි	වැඩිදුර පුහුණු
2. තෘතීය මට්ටම	ධනාත්මක	ප්‍රසංශාත්මක ලිපි	වැඩිදුර පුහුණු
3.ද්විතීක මට්ටම	ධනාත්මක	ප්‍රසංශාත්මක ලිපි	වැඩිදුර පුහුණු, අභ්‍යන්තර ස්ථාන මාරු
4.ප්‍රාථමික මට්ටම	ධනාත්මක	ප්‍රසංශාත්මක ලිපි	වැඩිදුර පුහුණු, අභ්‍යන්තර ස්ථාන මාරු

6.3 පුහුණුවේ ප්‍රතිඵල ඇගයීම සඳහා වන යාන්ත්‍රනය

සේවා ගණය	පුහුණුව මඟින් අපේක්ෂිත ප්‍රතිඵල (ධනාත්මක/පැහැදිලි නැත/වෙනසක් නැත)	ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කරන්නන් අගය කිරීමේ යාන්ත්‍රණය	අඩු කාර්ය සාධනයක් පෙන්නුම් කරන්නන් සඳහා වන යාන්ත්‍රණය
1. ජ්‍යෙෂ්ඨ මට්ටම - මාණ්ඩලික	ධනාත්මක	1. වැඩිදුර පුහුණු අවස්ථා 2. ප්‍රසංශාත්මක ලිපි	1. පුහුණු අවශ්‍යතා නැවත විශ්ලේෂණය
2. තෘතිය මට්ටම -	ධනාත්මක		2. පුහුණු අවශ්‍යතා නැවත විශ්ලේෂණය
3. ද්විතීක මට්ටම - මාණ්ඩලික නොවන	ධනාත්මක		1. නැවත පුහුණු කිරීම 3. අභ්‍යන්තර ස්ථාන මාරු
4. ප්‍රාථමික මට්ටම - මාණ්ඩලික නොවන	ධනාත්මක		

සකස් කරන ලද්දේ

2023/07/20

ආර්.ආර්.එස්.සී. රත්නායක
සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

අනුමත කරන ලද්දේ

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වැඩ

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2018 (I)

මගේ අංකය : MPA/HRD/ADMIN/Circular/01/2023

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2023.11.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන වල සභාපතිවරුන්

<u>රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම</u>

උක්ත මැයෙන් 2018.01.24 දිනැතිව නිකුත් කරන ලද අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතර වශයෙනි.

02. අංක 2289/43 හා 2022/07/22 දිනැතිව ප්‍රකාශයට පත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය සේවා පුහුණු සම්බන්ධ කාර්යභාරය මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුලත් කර ඇත. ඒ අනුව, මහජනතාව වෙත උසස් සේවාවක් සැපයීමේ අරමුණින් සියලු රාජ්‍ය සේවාවන්හි පූර්ණ ධාරිතා සංවර්ධනයක් ඇති කිරීම සඳහා විශේෂ අවධානයක් යොමුකිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් සැපයීමත්, රාජ්‍ය සේවයේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් යන අරමුණු පෙරදැරිව වෘත්තීය සංවර්ධනය ද ඇතුළත්ව සියළු රාජ්‍ය ආයතනයන්හි දීර්ඝ කාලීන මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයත්, එහි වැදගත්කම හා එවැනි සැලැස්මක ඇති ඵලප්‍රයෝජන පිළිබඳවත් නැවත අවධානය යොමුකරමි.

03. රාජ්‍ය සේවයේ සියළුම මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම් සම්බන්ධව පිළිවෙලින් 1998/03/13, 1998/04/30 හා 1998/12/11 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/98, 08/98 (i) හා 08/98 (ii) මඟින් හඳුන්වා දී ඇති කාර්යය සාධන ඇගයීම් සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍ර තවදුරටත් අර්ථපූර්ණ ලෙස යොදාගන්නා ලෙස මින් අවධාරණය කරනු ලැබේ. ඒ අනුව, උක්ත කාර්ය සාධන ඇගයීම් වාර්ථා මඟින් නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගෙන, එම අවශ්‍යතා සපුරාලීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා එමඟින් ඔවුන්ගේ කාර්යය සාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා ඔබගේ ආයතනය තුළ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට මෙමඟින් මග පෙන්වනු ලබන අතර ඒ වෙනුවෙන් සකස් කරන ලද මාර්ගෝපදේශය මෙහි උපලේඛනය මඟින් දක්වා ඇත. ඒ අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි (1) ඡේදය මින් සංශෝධනය කරනු ලබන අතර ඒ අනුව එම චක්‍රලේඛයේ සඳහන් පරිදි "වාර්ෂික කාර්ය සාධන ගිවිසුම්" අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවේ.

04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි ඡේද අංක 02 සිට 06 දක්වා වූ කරුණු තව දුරටත් වලංගු වන අතර එම කරුණු වඩාත් තහවුරු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මෙහි උපලේඛනයේ ඇතුලත් මාර්ගෝපදේශය මඟින් ලබාදෙනු ලැබේ. ඒ අනුව, ඔබ ආයතනයට අදාළ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සැකසීමේදී ඒ සඳහා උපයෝගී කරගත හැකිවන පරිදි එහි මෘදු පිටපත මෙම අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි මානව සම්පත් සංවර්ධන අංශයේ වෙබ් පිටුවෙහි පළකර ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලිකර ගැනීම් අවශ්‍ය නම් දුරකථන අංක 011 2694041 මඟින් මෙම අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශය සම්බන්ධ කරගත හැකි බවද සඳහන් කරමි.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය

පිටපත් :

01. ජනාධිපති ලේකම් - කරු අ.ක.ස.
02. අග්‍රාමාත්‍ය ලේකම් - කරු අ.ක.ස.
03. අමාත්‍ය මණ්ඩල ලේකම් - කරු අ.ක.ස.
04. විගණකාධිපති - කරු අ.ක.ස.

ඇමුණුම III

ROC/E/06/06/2019(2) 2024.01. 18

ආර්.ආර්.එස්.සී.රත්නායක මහතා,
සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් III,

මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සහ ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පත් කිරීම

2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුව ඇති බැවින් එම කටයුතු සිදු කිරීම සඳහා ඔබව පත් කරමි.

ඒ අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම ඔබ වෙත පවරනු ලැබේ.

පී.එස්.ඩී.තරංග පණ්ඩිත සුන්දර
නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

අ/කලේ: සංජීව දිසානායක
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

ok